**තංගල්ල ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-------------------------------**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 17 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට තංගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**--------------------------------------------**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

| ගිණුම්කරණ අඩුපාඩු | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ----------------------------- |
| (i) 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු. 8,228,603 ක් අඩුවෙන් දක්වා තිබීම නිසා එම වටිනාකමින් අවිනිශ්චිත ගිණුමක් ආරම්භ කර තිබුණු අතර ඉකුත් වර්ෂයේදී ජ'නල් සටහන් මඟින් නිරවුල් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| • 2017 වර්ෂය ආරම්භයේ මූල්‍ය ප්‍රකාශන හා ලෙජරයේ සමුච්චිත අරමුදල් ගිණුමේ රු. 17,399,501 ක වෙනස ගලපා තිබුණේ රු.3,535,925 ක් ලෙස වීමෙන් රු. 13,863,576 ක වෙනසක් විය. | ලෙජර් ගිණුම්වල නිවැරදි ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට වලට ගත යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| • ඉකුත් වර්ෂයේ අවසානයට මූල්‍ය ප්‍රකාශන හා ලෙජරයේ සමුච්චිත අරමුදල් ශේෂය අතර වූ රු. 4,691,887 ක මුදල හඳුනා ගැනීමකින් තොරව සමුච්චිත අරමුදලට නැවතත් හර කර තිබුණි. | අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනා ගැනීමෙන් අනතුරුව ගැලපීම් කළ යුතුවේ. | විගණන ඡේදය පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| | • පසුගිය වර්ෂයේ සමුච්චිත අරමුදලට කපා හැර තිබුණු රු. 4,691,887 ක ශේෂයෙන් රු. 4,674,634 ක් සමාලෝචිත වර්ෂයේ හඳුනා ගෙන තිබුණු අතර හඳුනා නොගත් රු. 17,253 ක ශේෂය අවිනිශ්චිත ගිණුමක දක්වා නොතිබුණි. | හඳුනා නොගත් ශේෂය අවිනිශ්චිත ගිණුමක දැක්විය යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී සභා දේපල සංවර්ධනය කිරීමට වැය කරන ලද රු. 3,056,002 ක වියදම ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කර්මාන්ත ණයහිමියන් වෙනුවෙන් රු. 1,000,000 ක් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබුණි. | ණය හිමි ශේෂ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | ඉකුත් වර්ෂයේ රු. 343,782 ක අයභාර වියදමක් ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ප්‍රාග්ධනිත කිරීම නිවැරදි කිරීම සඳහා නැවතත් එම වටිනාකමින්ම ප්‍රාග්ධනිත කිරීම නිසා ඉඩම් හා ගොඩනැගිලි රු. 687,564 ක් වැඩියෙන් ගිණුම්ගත වී තිබුණි. | නිවැරදි කිරීම නිවැරදිව සටහන් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (v) | ඉකුත් වර්ෂයේ ගිවිසුම්ගත වූ කඩ කාමර 04 කින් අයවිය යුතු රු. 345,000 ක් වූ එක්වන් මුදල් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | 2014 සිට සමාලෝචිත වර්ෂය දක්වා කඩ කාමර වෙනුවෙන් අයකරන ලද එකතුව රු. 2,802,312 ක එක්වන් මුදල්, යතුරු කාසි තැන්පත් ලෙස තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | එක්වන් මුදල් ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම් වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vii) | සමාලෝචිත වර්ෂයේ සභා ගොඩනැඟිලි පිරිසිදු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රු. 129,500 ක් ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ප්‍රමාද දෝෂයකින් එය සිදු වූ බවත්, මින් ඉදිරියට එසේ නොවීමට කටයුතු කරමි. |
| (viii) | සමාලෝචිත වර්ෂයේ සභාව සතු මාර්ගයක් පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කරන ලද රු. 157,500 ක් ස්ථාවර තැන්පත් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ආයෝජන නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2020 වර්ෂයේ ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 06 කට අදාළ එකතුව රු. 34,688,242 ක් වූ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන / ලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුවෙහි රු. 24,703,217 ක් වූ අසමානතාවයක් පැවතුණි. | ගිණුමේ දැක්වෙන ශේෂ වලට අදාල උපයෝගී ලේඛන නිවැරදිව ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | වෙනස පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු. 128,316,827 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාලව අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | විස්තරාත්මක උපලේඛන ඉදිරියේදී ඉදිරිපත් කරන අතර අයිතිය තහවුරු කිරීම පිළිබඳ අදාල අංශ දැනුවත් කරමින් පවතින අතර, වත්කම් සමීක්ෂණයද සිදු කරමින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | සභාව විසින් ඉකුත් වර්ෂයේදී ග්‍රාම සේවක වසම් 04 ක් දියුණු කළ ප්‍රදේශ ලෙස හඳුනාගෙන තිබුණද වරිපනම් බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 ජනවාරි 20 දින මාසික මහා සභා රැස්වීමේදී දේපල තක්සේරු කිරීම සඳහා අනුමැතිය ලැබී ඇති බැවින් එහි ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සඳහා අතිරික්තතා හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදී ලබා දීමට කටයුතු කරමි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>----------------- | | | |
| i. | මු. රෙ. 571 | වසර දෙක ඉක්ම වූ රු. 735,266 ක තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදී නිරවුල් කිරීමට කටයුතු කරමි. |
| ii. | මු. රෙ. 702(3) | කොන්ත්‍රාත් සම්බන්ධව අත්සන් කරනු ලබන ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ<br>----------------- | | | |
| i. | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 08 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වාහන 08 න් 02 ක මීටරය අක්‍රීය වීමත්, වාහන 02 ක ජල බවුසර් ගෙඩිය පමණක් තිබීම නිසා ඉන්ධන දහන පරීක්ෂාව සිදු නොකළ අතර, වාහන 04 ක මෙම පරීක්ෂාව 2020 ජුනි මස සිදු කල බව දන්වමි. |
| ii. | 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PED/REG/2015/ 08පොදු(i) දරන ලිපියේ 4.3 (අ), (ඉ) ඡේද ප්‍රකාරව | ඉකුත් වර්ෂයකට අදාළව ලැබිය යුතු 90,996 ක සේවක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යොමුගත ලිපියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

(ඉ) වෙනත් චක්‍රලේඛ
--------------------

| | | | | |
|---|---|---|---|---|
| i. | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 ජනවාරි 30 දිනැති අංක PFD / RED / COPA / 2019 / 01 දරන ලිපියේ 04 ඡේදය | වාර්ෂිකව කාර්යසාධන වාර්තාව සකස් කර නොතිබුණි. | කාර්යසාධන වාර්තා වාර්ෂිකව පිළියෙල කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වසරේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කිරීමට කටයුතු කරමි. |
| ii. | පළාත් පාලන කොමසාරිස්ගේ 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො/ 2010/01 දරන චක්‍රලේඛයේ 05 සහ 06 ඡේද | කඩ කාමර 08 ක ගිවිසුම් හා කඩ කාමර 05 ක තක්සේරුව යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | කඩ කාමර 03 ක ගිවිසුම් යාවත්කාලීන කළ බවත්, ඉතිරි කඩ කාමරවල ගිවිසුම් ඉදිරියේදී අත්සන් කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය
---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම, රු. 53,444,656 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 25,642,295 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය
---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජංගම ගිණුමකට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශයේ අත ඉතිරිය රු. 750,000 ක් ලෙස දක්වා තිබුණද, එදිනට අත ඉතිරි මුදලක් භෞතිකව නොතිබුණි. තවද මෙම ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ සිට වෙනස්වෙමින් ඉදිරියට එමින් පැවතුණු ශේෂයක් වුයෙන් වෙනස හඳුනාගෙන බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | නොසැසඳූ ශේෂ හඳුනා ගෙන බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතුවේ. | මුදල් තැන්පත් කර ඇති නමුත් ප්‍රාස 10 හා ප්‍රාස 02 වාර්තාවල සටහන් නොකිරීමේ අඩුපාඩු මගින් වෙනසක් සිදු වී ඇති බැවින්, තවමත් සොයා ගැනීමට නොහැකි ශේෂය රු.306,438 ක් වන අතර 2017 බැංකු සැසඳුම් නැවත සකස් කිරීමෙන් ගිණුම් ගැලපීමට කටයුතු කරමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | | | | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු කුලී | 570.000 | 913,606 | 920,686 | 635,947 | 560,000 | 930,786 | 823,238 | 382,909 |
| | 6,625,930 | 6,918,542 | 8,285,540 | 1,874,465 | 4,611,000 | 6,433,930 | 6,389,672 | 1,489,282 |
| බලපත්‍ර ගාස්තු | 3,000,000 | 5,599,260 | 5,922,152 | - | 3,000,000 | 2,536,269 | 2,536,269 | - |
| වෙනත් ආදායම් | 25,500,000 | 65,428,610 | 82,164,223 | 123,085,441 | 15,500,000 | 30,183,903 | 15,620,130 | 89,625,228 |
| එකතුව | 35,126,500 | 78,860,018 | 97,292,601 | 125,595,853 | 23,671,000 | 40,084,888 | 25,369,309= | 91,497,419 |

### 2.3.2 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ව්‍යාපාර ඒකක 424 කින් අයවිය යුතු ව්‍යාපාර බදු රු. 466,140 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 150(4) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. තවද එම හිඟ ශේෂය තුළ ව්‍යාපාර ඒකක 46 කින් ලැබිය යුතු රු. 107,450 ක් 2016 සිට 2018 දක්වා වර්ෂයන්ට අදාළ විය. | හිඟ ව්‍යාපාර බදු ආදායම අයකිරීමට කටයුතු කළ යුතුවේ. | හිඟ ව්‍යාපාරික බදු මුදලින් රු.46,850 ක් අය කරගෙන ඇති බවත්, රට තුළ පැවැති කොරෝනා වෛරසය හේතුවෙන් ඉතිරි හිඟ මුදල් අය කර ගැනීමට නොහැකි වූ අතර එම මුදල් අය කරගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) | ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපාර බදු හිඟය පිළිවෙලින් රු. 121,440 ක් හා රු. 358,690 ක් වූයෙන් හිඟය සියයට 195 කින් වර්ධනය වී තිබුණි. | හිඟ ව්‍යාපාර බදු ආදායම අයකර ගැනීම් ප්‍රගතිය ඉහළ නංවා ගත යුතුවේ. | විගණන වාර්තාවේ ව්‍යාපාරික බදු හිඟය හා අවසාන ගිණුමට දී ඇති උපලේඛන අනුව වෙනසක් පවතින බවත්, 2018 සහ 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපාරික බදු හිඟය පිළිවෙලින් රු.181,890 ක් හා රු.466,140 ක් වන බවත්, හිඟයෙන් රු.46,850 ක් අය කරගෙන ඇති බවත්, රට තුළ පැවැති කොරෝනා වෛරසය හේතුවෙන් ඉතිරි හිඟ මුදල් අය කර |

| | | | |
|---|---|---|---|
| | | | ගැනීමට නොහැකි වූ අතර එම මුදල් අය කරගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට ලැබිය යුතු අක්කර බදු ශේෂය රු. 169,807 ක් වූ අතර මෙම ශේෂය තුළ ඉකුත් වර්ෂයන්ට අදාළ රු. 155,534 ක් විය. | වාර්ෂික සමීක්ෂණයක් සිදු කර හිඟ අක්කර බදු ආදායම අයකිරීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදලෙන් රු.2,526 ක් අය කරගෙන ඇති බවත්, පදිංචිය හැරයාම, ඉඩම් කැබලි වීම, විකිණීම ආදිය නිසා 2015 සිට 2018 වර්ෂය දක්වා හිඟය ඉහල අගයක් ගෙන ඇත. |

**2.3.3 කුලී**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාව සතු කඩ කාමර 43 කින් අයවිය යුතු කඩ කුලී හා දඩ පිළිවෙලින් රු. 860,829 ක් හා රු. 45,125 ක් විය. | හිඟ කුලී කඩිනමින් අයකර ගත යුතුවේ. | මේ වන විට හිඟයෙන් රු.140,290 ක් සහ දඩ රු. 7,423 ක් අයකර ගෙන ඇති අතර, ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා කඩ කුලී හිඟය පිළිවෙලින් රු. 422,759 ක් හා රු. 860,829 ක් වූයෙන් හිඟය සියයට 104 කින් වර්ධනය වී තිබුණි. | හිග කඩ කුලී ආදායම් රැස් කිරීමේ ප්‍රගතිය වර්ධනය කරගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2018 හා 2019 වර්ෂයන් සඳහා වූ හිඟය තුළ 2017 පෙබරවාරි 15 දින මුද්‍රා තබන ලද කඩ කාමර 07 ක් සඳහා ලැබිය යුතු රු.370,370 ක් ඇතුළත්ව ඇති අතර, එම මුදල් අය කර ගැනීමට නීතිමය කටයුතු සිදු කිරීම සඳහා 2018 මාර්තු 08 දින ලිපිගොනු භාර දී ඇත. හිඟ මුදලෙන් රු.140,290 ක් අය කරගෙන ඇති අතර ඉතිරි රු.322,485 ක මුදල අය කර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව දන්වමි. |
| (ඇ) | සභාවේ දේපල බදු දීම මත සමාලෝචිත වර්ෂයේ අවසානයට දේපල 05 කින් ලැබිය යුතු බදු හා දඩ මුදල් පිළිවෙලින් රු. 513,825 ක් හා රු. 500,072 ක් වූ අතර එම හිඟයෙන් වර්ෂ 02 ත් 05 ත් අතර හා වර්ෂ 05ට වැඩි ශේෂය පිළිවෙලින් රු. 29,922 ක් හා රු. 608,874 ක් විය. තවද වර්ෂ 05 ට වැඩි ශේෂය මුළු හිඟයෙන් සියයට 60 ක් විය. | හිඟ බදු හා දඩ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේ සිදු වූ පාස්කු ප්‍රහාරය හේතුවෙන් රන්න හා තේනගම සති පොල නොපැවැත්වීම නිසා පිළිවෙලින් රු.64,685 ක් සහ රු. 34,915 ක් කපා හැරීම සඳහා ආණ්ඩුකාරතුමා වෙත යොමු කිරීමට කටයුතු කලෙමි. |

**2.3.4** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානයට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සභාවට අයවිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 4,857,999 ක් හා රු. 118,095,249 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු වලින් රු. 12,500,000 ක් අයවී ඇති බවත්, ඉතිරි මුදල් අයකර ගැනීමටත් කටයුතු කරමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කරුණු 29 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | තංගල්ල නාගරික ප්‍රදේශයක් වන බවත්, දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීමේ ගාස්තු පිළිබඳ ගැටළු සහගත බැවින් එම අතුරු ව්‍යවස්ථාව වැළඳගෙන නොමැති බව දන්වමි. |

**(ආ)** **අපේක්ෂිත නිමයුම් මට්ටම ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය මඟින් සංවර්ධන යෝජනා 24 ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 13,900,000 ක් වෙන්කර තිබුණද, රු.4,300,000 ක් වැයකර යෝජනා 05 ක් පමණක් ඉටුකර තිබූ අතර, සංවර්ධන යෝජනාවල | වාර්ෂික අයවැය ලේඛනයේ ඇතුළත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුවේ. | 2019 අයවැය ලේඛනයේ ප්‍රාග්ධන වැය යටතේ යෝජිත ව්‍යාපෘති 23 ක් තිබුණත් සභාවේ පැවති මුදල් තත්වය මෙන්ම එම වර්ෂයේ පැවති කාලගුණික හා දේශගුණික තත්වය මත සහා බල ප්‍රදේශයේ මහ |

| | | |
|---|---|---|
| ඇතුළත් නොවූ ව්‍යාපෘති 06 ක් රු. 5,059,759 ක් වැයකර ඉටුකර තිබුණි. ප්‍රාග්ධන ආධාර යටතේ ව්‍යාපෘති 23 ක් සඳහා රු. 21,200,000 ක් වෙන් කළද වියදම රු. 1,512,846 ක් වූ එක් ව්‍යාපෘතියක් පමණක් ඉටුකර තිබුණි. | | ජනතාවට වැඩි ප්‍රයෝජනවත් වන කර්මාන්ත පමණක් ඉටු කළෙමි. |

(ඇ) **කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ සහා අරමුදලින් ඉටු කිරීමට යෝජිතව තිබුණු ඇස්තමේන්තු වටිනාකම රු. 675,853 ක් වූ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට මුරකුටිය ඉදිකර නොතිබුණි. | සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන මුදල් නොපමාව යෙදවීම සිදුකළ යුතුවේ. | සමාලෝචිත වර්ෂයේ සභා අරමුදලින් ඉටු කිරීමට යෝජිතව තිබුණු මෙම කර්මාන්තයේ ඇස්තමේන්තු පළාත් පාලන දෙපාර්තමේන්තු අනුමැතියට යොමු කළ ද, විවිධ හේතු නිසා වැඩ පමා වූ බවත්, මේ වන විට කොන්ත්‍රාත් සංවිධානය වෙත නැවත වැඩ ආරම්භ කරන ලෙස ලිපි මගින් දන්වා යවා ඇති බව දන්වමි. |

(ඈ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබාගෙන නොතිබුණු අතර මධ්‍යම පරිසර අධිකාරියේ 2015 දෙසැම්බර් 09 දිනැති ලිපිය පරිදි මෙම ව්‍යාපෘතිය ඉටු කිරීම සඳහා කොන්දේසි දක්වා තිබුණද, ඒවා ඉටුකිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් අවසරයන් ඇතිව කළ යුතුවේ. | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පරිසර ආරක්‍ෂණ බලපත්‍ර ලබා දීමේදී දී ඇති කොන්දේසි වලින් කොටසක් සපුරා ඇති අතර, ඉතිරි කොටසද මෙම වසර තුල සපුරා ගැනීමට කටයුතු කර පරිසර ආරක්‍ෂණ බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කරමි. |

**(ඇ) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටු කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනා ගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය හා සෞඛ්‍ය නංවාලීම සඳහා වන දීර්ඝ කාලීන සැලසුම් සකස් කිරීමට පියවර ගන්නා බව දන්වමි. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

සේවක පුරප්පාඩු හා අතිරික්තතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 03 ක් පිරවීමට සහ අතිරික්තතා 45 ක් විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සේවක අතිරික්තතා විධිමත් කර ගැනීමට හා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පුරප්පාඩු 03 බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |
| (ආ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි සමස්ථ කාර්යය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් සහ මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අදාල ගිවිසුම් හා සැලසුම් පිළියෙල කිරිමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මානව සම්පත් සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. සභාව ඉකුත් වර්ෂයන්වලදී ලබා දුන් පරිසර ආරක්ෂණ බලපත්‍ර හා ඒවායේ වලංගු කාලය පිළිබඳව විධිමත් හා යාවත්කාලීන තොරතුරු පවත්වා නොතිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර කාලීනව ලබා දිය යුතුවේ. | අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**3.4.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් සභාව භුක්ති විඳින ඉඩම් 30 ක, ගොඩනැගිලි 09 ක හා වාහන 09 ක නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වල නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | දැනට සභාව භුක්ති විඳින ඉඩම් හා ගොඩනැගිලි වලින් අයිතිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු දේපළ සභාව වෙත පවරා දෙන මෙන් ඉල්ලීම් කර ඇත. වාහන 09 න් 02 ක ණය වාරික ගෙවීම් නිම වී නොමැති නිසා පවරා නොගත් බවත්, එක් වාහනයක් පවරාගෙන ඇති අතර, වාහන 06 ක පවරා ගැනීම් කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

**3.4.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නෙටොල්පිටිය හා රන්න පුස්තකාල භූමියේ කඩ කාමර 02 ක් සහ ඩබල් කැබ් රථ 02 ක් පිළිවෙලින් 2011 හා 1996 වර්ෂවල සිට නිෂ්ක්‍රීයව පැවති අතර එම වත්කම් අපහරණය කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා කිහිප අවස්ථාවකදීම පුවත්පත් දැන්වීම් පල කරනු ලැබුවත් ඒ සඳහා කිසිදු ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් නොවූ අතර, කැබ් රථය අපහරණ කිරීමට කටයුතු කරමි. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.3 ඡේදයන් ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබූ නමුත් එහි ඇති අඩුපාඩු විධිමත් ලෙස සකස් කිරීමටත්, 2020 වර්ෂයේදී නිවැරදිව සිදු කරන බව දන්වමි. |

## 3.5.2 සැපයීම් හා සේවා

-------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>----------- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>------------------------------------ |
|---|---|---|---|
| (අ) | අවස්ථා 08 කදී රු. 909,674 ක් වූ වීඊී පහන් උපකරණ මිලදී ගැනීම, අවස්ථා 04 කදී රු. 197,250 ක් වූ ටෝනර් මිලට ගැනීම, අවස්ථා 02 කදී එකතුව රු. 150,000 ක් වූ ටිකට්පත් මුද්‍රණය කිරීම හා රැස්වීම් ශාලාවට ශ්‍රව්‍ය පහසුකම් හා පටිගත කිරීමේ පහසුකම් ලබා ගැනීම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.3.2 ඡේදයට අනුකූලව සිදු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | වීඊී පහන් මිලට ගැනීම් , ටෝනර් මිලට ගැනීම් සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් පෙර අනුමත කරන ලද තීරණ පදනම් කරගෙන මාස 06 ක කාලයක් තුළ මිලදී ගැනීම් සිදු කර ඇති අතර, ටිකට්පත් මුද්‍රණය කිරීම් මුදල් හා ප්‍රතිපත්ති කමිටුව විසින් අනුමත කර ඇති බවත්, රැස්වීම් ශාලාවට ශ්‍රව්‍ය පහසුකම් හා පටිගත කිරීමේ පහසුකම් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති බව දන්වමි. |
| (ආ) | සභාවේ ප්‍රසම්පාදන කටයුතු 03 ක් සඳහා මිල ගණන් කැඳවීම් සිදු කිරීමට පෙර ලංසුකරුවන් මිල ගණන් එවා තිබීමෙන් ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයකින් සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන කටයුතු විනිවිදභාවයකින් යුක්තව සිදු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරමි. |